**කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව**

***දුරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය***

**වාණිජ හා කළමනාකරණ අධ්‍යයන පීඨය**

ව්‍යාපාර කළමනාකරණවේදී (සාමාන්‍ය) උපාධි පළමු පරීක්ෂණය (බාහිර) - 2014

මාර්තු - 2019

**BMGT E1045 - ව්‍යාපාර නීතිය**

ප්‍රශ්න සංඛ්‍යාව : අටයි (08) කාලය : පැය 03 යි

**ඕනෑම ප්‍රශ්න පහකට (05) පිළිතුරු සපයන්න.**

(01) අ) ප්‍රභාත් සිය උපාධිය සඳහා ප්‍රථම පන්තියේ පන්ති සාමාර්ථයක් ලබා ගතහොත් ඔහුට BMW වර්ගයේ මෝටර් රථයක් රැගෙන දෙන බවට ප්‍රභාත්ගේ පියා ප්‍රභාත්ට පොරොන්දු විය. ප්‍රභාත් බොහෝ වෙහෙස මහන්සි වී පාඩම් කොට ප්‍රථම පන්ති සමර්ථයක් ලබා ගත්තේය. ප්‍රභාත් සිය පියාගෙන් තමාට ලබා දෙන බවට පොරොන්දු වූ BMW රථය ඉල්ලා සිටි විට පියා සිනා සී අසා සිටියේ, මෝටර් රථයක් තමා ලබාදෙන්නේ යැයි ප්‍රභාත් ඇත්ත වශයෙන්ම සිතුවේද යන්නය. එසේ තමා පැවසුයේ ප්‍රභාත්ව අධ්‍යාපන කටයුතු සඳහා උනන්දු කිරීම සඳහා වන බවද පියා ප්‍රකාශ කළේය. මෙයින් අපේක්ෂා භංගත්වයට සහ කෝපයට පත් ප්‍රභාත්ට සිය පියාට එරෙහිව නීතිමය පියවර ගැනීමට අවශ්‍යව ඇත.

ප්‍රභාත්ගේ පියා විසින් ඔහු වෙත BMW රථයක් මිලදී ගත යුතු දැයි සාකච්ඡා කරන්න.

(ලකුණු 10)

ආ) "සාප්පු වල ප්‍රදර්ශන කවුළු තුල භාණ්ඩ ප්‍රදර්ශනයට තැබීම සහ සුපිරි වෙළඳසැල්හි විවෘත රාක්ක මත භාණ්ඩ ප්‍රදර්ශනය කිරීම ඒවා විකිණීම සඳහා අර්පනයන් ඉදිරිපත් කිරීමක් බැව් බොහෝ පුද්ගලයෝ විශ්වාස කරති." නමුත් මෙහි නීතිමය තත්ත්වය හාත්පසින් වෙනස්ය. ඉහත ප්‍රකාශය සුදුසු විනිශ්චිත නඩු තීන්දු ඇසුරින් විස්තර කරන්න.

(ලකුණු 10)

**(මුළු ලකුණු 20)**

(02) අ) ගිවිසුම් නීතියට අනුව පහත සඳහන් ප්‍රකාශ වලංගුදැයි දක්වන්න.

(i) බාලවයස්කරුවෙකුගේ යහපත සඳහා ඔහු සමග ඇතිකරගත් ගිවිසුමක් බලාත්මක කළ නොහැක.

(ii) වැඩිහිටියෙකු වෙත බාලවයස්කරුවෙකු විසින් විකුණූ භාණ්ඩ සඳහා ඔහුට මුදල් ලබාගත හැකිය.

(iii) බාලවයස්කරුවෙකු, වැඩිහිටියෙකු බවට පත්වීමෙන් අනතුරුව, ඔහු විසින් බාලවයස්කරුවෙකු වශයෙන් එළඹුණු ගිවිසුමක් සඳහා අනුමැතිය දිය හැකිය.

(iv) සිහිමද පුද්ගලයෙකු විසින් සෑදූ ගිවිසුමක් ශූන්‍ය වේ.

(v) විවාහක කාන්තාවකට වලංගු ගිවිසුමකට එළඹිය නොහැක.

(ලකුණු 10)

ආ) බිමල්ට අයත් නිවසක අමල් කුලී නිවැසියකි. මෙයට දින 10 කට පෙර බිමල්ගෙන්, ලිපියක් අමල් වෙත ලැබෙන අතර එහි සඳහන් වූයේ දැනට අමල් පදිංචි වී සිටින බිමල්ගේ නිවාස ඒකකය රු. මිලියන 10 කට විකිණීමට ඔහු අදහස් කරන බව සහ අමල් ඒ පිළිබඳව කැමැත්තක් දක්වයි නම් ඒ බව තමා වෙත දන්වා එවන ලෙසය. දින තුනකට පසු අමල්, බිමල් වෙත ලිපියක් තැපැල් කරමින් දන්වන ලද්දේ බිමල් සඳහන් කළ මිලට නිවස මිලදී ගැනීමට කැමති බවයි. අමල්ගේ ලිපිය තමා වෙත ලැබීමෙන් අනතුරුව බිමල්, අමල් වෙත දුරකථනයෙන් පවසා සිටියේ තමා අදාල නිවස විකිණීම නතර කිරීමට තීරණය කර ඇති බවය.

අදාල නිවාස ඒකකය විකිණීම සම්බන්ධයෙන් තමා සහ බිමල් අතර ගිවිසුමක් නිර්මාණය වී ඇතිදැයි අමල්ට ඔබගෙන් දැන ගැනීමට අවශ්‍යව ඇත. ඔහුට උපදෙස් දෙන්න.

(ලකුණු 10)

**(මුළු ලකුණු 20)**

(03) අ) මෝටර් රථයක් විකිණීම සඳහා ජෝන් වෙළඳ දැන්වීමක් පළ කරන අතර එහි තවදුරටත් සඳහන් වූයේ අදාල රථය 2010 වසරේ නිෂ්පාදිත එකක් බවයි. ඩේවිඩ් අදාල රථය පරීක්ෂා කිරීමෙන් අනතුරුව මිලදී ගත්තේය. මෝටර් රථය මිලදී ගැනීමෙන් අනතුරුව හෙළිදරව් වූයේ අදාල රථයේ පසුපස කොටස පමණක් විස්තරයට අනුකූල වන බවය. වෙනත් රථයක කොටසක් ඉදිරිපස කොටසට පුරුද්දා තිබුණි. ඩේවිඩ්ට අදාල ගිවිසුම අවලංගු කිරීමට අවශ්‍යව ඇත.
අදාල ගිවිසුම, ඩේවිඩ්ට අවලංගු කළ හැකිදැයි විනිශ්චිත නඩු තීන්දු ඇසුරින් පැහැදිලි කරන්න.

(ලකුණු 10)

ආ) භාණ්ඩ විකිණීමේ ආඥා පනතේ සඳහන් භාණ්ඩ සාම්පල් මගින් විකිණීම යන ව්‍යාංග කොන්දේසියට අදාල විධිවිධානයන් පිළිබඳව සාකච්ඡා කරන්න.

(ලකුණු 10)

**(මුළු ලකුණු 20)**

(04) අ) යාපනයේ පිහිටුවා ඇති යාපන වෙළඳ සමාගමේ නියෝජිත වන සිවා, එම සමාගම වෙත යැවීම සඳහා කම්ස විශාල තොගයක් කොළඹින් මිලදී ගන්නා ලදී. එම වකවානුව තුළ යාපනයේ දීර්ඝ කාලයක් පැවති අධික වැසි සහ ගංවතුර තත්ත්වය හේතුකොට ගෙන අදාල කම්ස තොගය යාපන වෙළඳ සමාගම වෙත යැවීමට හෝ ඔවුන් සමග සන්නිවේදනය කිරීමට සිවා හට නොහැකි විය. එබැවින් සිවා, අදාල කම්ස තොගය කොළඹදී විකුණා දැමූ අතර ඒ වන විටත් ඒවායේ මිල වැඩි වී තිබුණු බැව් ඔහු දැන සිටියේ නැත. ටික කලකට පසුව කම්ස විකුණා ලැබූ මුදල අදාල සමාගම වෙත සිවා විසින් යවන ලදී. යාපන වෙළඳ සමාගම, මේ සම්බන්ධයෙන් සිදු වූ හානිය සඳහා වන්දි ඉල්ලා සිවා ට එරෙහිව නඩු දැමීමට අදහස් කරයි. සිවාට මේ සම්බන්ධයෙන් වන්දි ගෙවීමට වගකීමක් තිබේදැයි, යන්න විනිශ්චිත නඩු තීන්දු ඇසුරින් සාකච්ඡා කරන්න.

(ලකුණු 10)

ආ) බන්දු, නුගේගොඩ ප්‍රදේශයේ හෝටලයක් පවත්වා ගෙන ගියේය. පසුව මෙම හෝටලය ABC පුද්ගලික සමාගම විසින් මිලදී ගන්නා ලදී. ඉන් අනතුරුව අදාල සමාගම එහි සාමාන්‍යාධිකාරී ලෙස බන්දු පත් කළ අතර, අදාල හෝටලය සඳහා භාණ්ඩ ණයට මිලදී නොගන්නා ලෙස ඔහුට උපදෙස් දෙන ලදී. කෙසේ වෙතත් බන්දු, මෙම හෝටලය විකිණීමට පෙර සිදු කළ ආකාරයටම, අලියා සමාගම වෙතින් බීම තොගයක් ණයට ලබා ගත්තේය. අදාල ණය ගණුදෙනු උදෙසා මුදල් ගෙවීම ABC පුද්ගලික සමාගම ප්‍රතික්ෂේප කළේය. අලියා සමාගම ABC සමාගමට විරුද්ධව නීතිමය පියවර ගැනීමට අදහස් කරයි. අලියා සමාගමට උපදෙස් දෙන්න.

(ලකුණු 10)

**(මුළු ලකුණු 20)**

(05) අ) "චෙක්පතක් සහ විනිමය බිල්පතක් අතර මූලික වෙනස්කම් ඇත." චෙක්පතක් සහ විනිමය බිල්පතක් අතර ඇති ප්‍රධානතම වෙනසක් වනුයේ චෙක්පතක් රේඛනය කළ හැකි වීමයි. චෙක්පතක් රේඛනය කිරීමෙන් එයට වැඩි ආරක්ෂාවක් සහ වටිනාකමක් ලැබේ." විවිධ වූ චෙක්පත් රේඛනය කිරීමේ ක්‍රම දක්වා ඒවා එකිනෙකෙහි නෛතිකමය බලපෑම දක්වන්න.

(ලකුණු 10)

ආ) X සිය ලිපිකරු වෙත දන්වා සිටියේ එක්තරා මුදලක් ගෙවීම සඳහා චෙක්පතක් සූදානම් කරන ලෙසය. අදාල ලිපිකරු චෙක්පත ලියූ අතර ඉලක්කම් මගින් එහි රු. 10,000/= සඳහන් කරන ලද නමුත් එම වටිනාකම අකුරින් සඳහන් කළේ නැත. අදාල චෙක්පත සඳහා X අත්සන් තැබීමෙන් අනතුරුව, ලිපිකරුවා විසින් චෙක්පතේ සඳහන් මුදල් ප්‍රමාණය රු. මිලියනයක් ලෙස වංචනිකව වෙනස් කළේය. ඉන් අනතුරුව බැංකුව විසින් චෙක්පත සඳහා මුදල් ගෙවන ලදී. මේ සම්බන්ධයෙන් බැංකුවට එරෙහිව නඩු පැවරීමට X ට හැකිද?

(ලකුණු 05)

ඇ) ගණුදෙනුකරුවෙකුගේ චෙක්පතක් ඔබ වෙත ලැබුණු විට, එම චෙක්පත සම්බන්ධයෙන් ඔබ විසින් පරීක්ෂා කළ යුතු වැදගත් දෑ මොනවාදැයි දක්වන්න.

(ලකුණු 05)

**(මුළු ලකුණු 20)**

(06) අ) නියෝජිතයෙකු විසින් තෙවන පාර්ශවයක් සමග ඇති කරගන්නා ගිවිසුම්වල පහත සඳහන් අවස්ථාවල දී ඇතිවන බලපෑම විස්තර කරන්න.

(i) ප්‍රධානියාගේ නම හෙළි දරව් කිරීම.

(ii) ප්‍රධානියාගේ පැවැත්ම හෙළි දරව් කිරීම.

(iii) ප්‍රධානියාගේ පැවැත්ම හෙළි දරව් නොකිරීම.

(ලකුණු 09)

ආ) A සහ B රසායනික ද්‍රව්‍ය විකුණන්නා වූ ව්‍යාපාරයක හවුල්කරුවන් වූ අතර අදාල හවුල් ව්‍යාපාරය පවත්නා කාලසීමාවේදී, හවුල් ව්‍යාපාරයට යහපතක් වන්නේ මිස කිසිඳු හවුල්කරුවෙකු ඍජුව හෝ වක්‍රාකාරව මීට සමාන ව්‍යාපාර කටයුතුවල නියුක්ත නොවන බවට හවුල් ව්‍යාපාර ගිවිසුමට අනුව ඔවුන් එකග වී තිබුණි. අදාල හවුල් ව්‍යාපාරය අවසානයට පත්වීමෙන් අනතුරුව A ට දැන ගැනීමට ලැබුනේ, හවුල් ව්‍යාපාරය පවත්නා කාල සීමාව තුළ B රසායනික ද්‍රව්‍ය නිපදවීමේ තරගකාරී ව්‍යාපාරයක නියුක්ත වී සිටි බවයි. මේ සම්බන්ධයෙන් A වෙත උපදෙස් දෙන්න.

(ලකුණු 06)

ඇ) අධිකරණයෙහි මැදිහත්වීමකින් තොරව හවුල් ව්‍යාපාරයක් අවසානයට පත්වන අවස්ථා මොනවාදැයි දක්වන්න.

(ලකුණු 05)

**(මුළු ලකුණු 20)**

(07) අ) සීමාසහිත වෙස්ට් ෆුඩ්ස් පෞද්ගලික සමාගමේ ආපනශාලාවක කෝකියෙකු ලෙස සිරිමල් කටයුතු කළේය. ඔහු උදේ කාලයේ සහ රාත්‍රී කාලයේ සේවය සඳහා පැමිණි අතර ඒ සඳහා පූර්ණ නිදහස ඔහුට තිබුණි. ඔහුගේ කාර්ය අවසන් වූ විට ඔහුට ආපනශාලාවෙන් පිටව යාමට හැකි විය. ඔහුට ගෙවනු ලැබුවේ වැඩ කළ පැය ප්‍රමාණය මතය. එසේම මුළුතැන්ගෙය සඳහා අවශ්‍ය උපකරණ ඔහු විසින්ම රැගෙන ආ අතර ඔහු ඉවත්ව යන විට ඒවා රැගෙන ගියේය. මේ ආකාරයට, සිරිමල් වෙස්ට් ෆුඩ්ස් ආයතනය සමග පුරා පස් වසරක් වැඩ කළේය. දිනක් සේවය සඳහා ඔහු පැමිණි විට, අයිතිකරු හදිසියේම දන්වා සිටියේ මින් ඉදිරියට තවදුරටත් ඔහුගේ සේවය අවශ්‍ය නොවන බවයි. මේ සම්බන්ධයෙන් ඔහු වෙත පූර්ව දැනුම්දීමක් හෝ වන්දි ලබා දීමක් සිදුකළේ නැත. ඔහු නම්‍යශීලී පදනම මත වැඩ කළ හෙයින්, ලිඛිත රැකියා ගිවිසුමක්ද තිබුනේ නැත. අවම වශයෙන් තමාට පසුගිය වසර පහ උදෙසා හිමි සේවක අර්ථසාධක අරමුදල සහ සේවක භාරකාර අරමුදල සඳහා දායකත්ව මුදල් ලබා ගැනීමට ඔහුට අවශ්‍යව ඇත. එකී අරමුදල් ලබාගැනීම සඳහා සිරිමල්ට අයිතියක් තිබේද යන්න සාකච්ඡා කරන්න.

(ලකුණු 12)

ආ) සේවකයන්ට පාරිතෝෂික ගෙවීම සම්බන්ධයෙන් සේවායෝජකයෙකු සතු වගකීමේ ස්වභාවය 1983 අංක 12 දරන පාරිතෝෂික ගෙවීමේ පනතේ විධිවිධාන අනුව, සාකච්ඡා කරන්න.

(ලකුණු 08)

**(මුළු ලකුණු 20)**

(08) අ) නීතියේ පරමාර්ථ හතරක් (04) ක් නම් කරන්න.

(ලකුණු 04)

ආ) ශ්‍රී ලංකාවේ නීතියට අනුව, යම් සිරිතක් වලංගු නෛතිකමය රීතියක් ලෙස පිළිගැනීම සඳහා අප අධිකරණය විසින් භාවිතා කරන්නා වූ විවිධ වූ නිර්ණායකයන් කවරේද යන්න සුදුසු විනිශ්චිත නඩු තීන්දු ඇසුරින් පැහැදිලි කරන්න.

(ලකුණු 08)

ඇ) ශ්‍රී ලංකාවේ ශ්‍රේෂ්ඨාධිකරණයේ සංයුතිය සහ එහි අධිකරණ බලය පිළිබඳව සටහනක් ලියන්න.

(ලකුණු 08)

**(මුළු ලකුණු 20)**